ol=Kq m<d;a wOHdmk fomd¾;fïka;=j ol=Kq m<d;a wOHdmk fomd¾;fïka;=j
Department of Education, Southern Province Southe

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය -2023
## Second Term Test- 2023

| | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය<br>Grade 8 | **ඉතිහාසය** | පැය දෙකයි<br>Two hour |

**නම/අංකය- ....................................................................**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

(01).ශ්‍රී ලංකාව මහ වැව් තැනීම ආරම්භ කරන්නේ කුමන රාජ්‍ය සමයේ ද?
1. දේවානම්පියතිස්ස 2.පණ්ඩුකාභය
3. වසභ 4.විජය

(02).“මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මදකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුද ට නොයේවා”යන ආදර්ශ පාඨය අනුව කටයුතු කල රජතුමා කවුරුන් ද?
1. පණ්ඩුකාභය 2. මහාපරාක්‍රමබාහු
3. මහසෙන් 4. වසභ

(03).ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගය ට අයත් චිත්‍ර සටහන් වල අවශේෂ හමුවී ඇති ලෙනක් නොවන්නේ කුමක් ද?
1. සිතුල්පව්ව 2.වෙස්සගිරිය
3. හිඳගල 4.තිවංක පිළිමගේ

(04).පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට සමත් වූ උඩරට පාලකයා කවුරුන් ද?
1. පළමුවන විමලධර්මසූරිය රජතුමා 2.දෙවන රාජසිංහ රජතුමා
3. සෙනරත් රජතුමා 4.පළමුවන රාජසිංහ රජතුමා

(05).ප්‍රථම වරට උඩරට රජු හමු වීමට පැමිණි ඉංග්‍රීසි දූතයා ලෙස සැලකෙන්නේ ,
1.ජෝන් ෆයිබස් 2.රොබට් ඇන්ඩෘස්
3.හියුබොයිඩ් 4.විලියම් හෝකින්ස්

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුල යොදන්න.**

(06). මල්වතු ඔය හරස්කර ඉදිකරන ලද තෙක්කම් අමුණෙන් ආරම්භ වන ඇළ මගින් තිසා වැවට ජලය සපයයි. ( )
(07). රන්මසු උයන ඉදිකරන ලද්දේ රාජකීයයන් ගේ පරිහරණය සඳහා ය. ( )
(08). රජරට යුගයට අයත් කලාත්මක ම වටදාගෙය වන්නේ මැදිරිගිරිය වටදාගෙය යි ( )
(09). ලෙන් විහාරවල ප්‍රධාන ප්‍රතිමාව හිඳි පිළිමයක් ලෙස නිර්මාණය කිරීම විශේෂ ලක්ෂණයකි. ( )
(10). 1594 දී දන්තුරේ සටනින් පෘතුගීසීන් පරාජයට පත් කලේ පළමුවන විමළධර්මසූරිය රජතුමාය. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්ණවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(11). දළදා මාළිගාව ට චිත්තාකර්ෂණීය පත්තිරිප්පුව එක් කරන ලද්දේ ............................රජතුමා විසිනි. (ශ්‍රී වික්‍රමරාජසිංහ/පළමුවන විමළධර්මසූරිය/ දෙවන විමලධර්මසූරිය)
(12). ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් සතු වන විට උඩරට පාලකයා වූයේ ........................................ රජතුමා ය.(රාජාධිරාජසිංහ/කීර්ති ශ්‍රී රාජසිංහ/ශ්‍රී විජය රාජසිංහ)
(13). මහනුවර රාජ්‍ය සමයේ බුදු දහමේ හරය ජනතාව වෙත ගෙනයාමේ මාධ්‍යයක් ලෙස................................ යොදාගන්නා ලදී.(චිත්‍ර කලාව/නාට්‍ය කලාව)
(14). වැලිවිට ශ්‍රී සරණංකර හිමියන් ගේ උපදෙස් පරිදි ....................................රජතුමා සියමෙන්,උපාලි හිමියන් ප්‍රධාන භික්ෂූන් වහන්සේ ලා වැඩම කොට උපසම්පදා උත්සවය පවත්වන ලදී.(පළමුවන විමළධර්මසූරිය/කීර්ති ශ්‍රී රාජසිංහ/දෙවන රාජසිංහ)

(15). යුරෝපයේ පුනරුද සමයේ දී.............................. විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගන්නා ලදී.(ජොහැන්නස් ගුටෙන්බර්ග්/ජෝර්ජ් ස්ටීවන්සන්/ඩෙම්ලර්)

- **16 වන ප්‍රශ්නයේ සිට 20 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(16). රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ ඇති අගනා චිත්‍ර නිර්මාණය කරන ලද්දේ .................................විසිනි.
(17). සෞරග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහ වස්තු සූර්ය වටා ඉලිප්සාකාර ගමන ක යෙදෙන බව.............................. සොයා ගන්නා ලදී.
(18). පුනරුද සමයේ පල්ලියේ බලයට එරෙහි ව නැගී සිටි කණ්ඩායම්................................ ලෙස හැඳින්වේ.
(19). ප්ලෝරන්ස් නගරයේ නිර්මාණය කර ඇති ශාන්ත ජෝන් ප්‍රතිමාව........................ ගේ නිර්මාණයකි.
(20). මහනුවර රාජ්‍යය, කෝට්ටේ රාජ්‍යය යෙන් නිදහස් කර ගැනීම සඳහා හය වන පරාක්‍රමබාහු රජුට එරෙහි ව කැරැල්ලක් ආරම්භ කලේ.......................................විසිනි.

## II කොටස

- **පලමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.**

(01). (අ) ලංකා සිතියමේ දක්වා ඇති ස්ථාන වලට අදාළ අක්ෂර පහත ලැයිස්තුවෙන් තෝරා පිළිතුරු පත්‍රයේ ම ලියන්න.

1. යෝධ වැව
2. මහවැලි ගංගා
3. කෝට්ටේ
4. මහනුවර
5. අනුරාධපුරය
6. සීගිරිය




(ලකුණු 6)

(ආ).1. යාබද රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2.මෙම නිර්මාණය අයත් වන්නේ කුමන යුගයටද?
3.මේවා නිර්මාණය කිරීමෙන් අපේක්ෂා කලේ කුමක්ද?



(ලකුණු 3)



(ඇ). 1.යාබද පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2.මෙය නිර්මාණය කල ශිල්පියා නම් කරන්න.
3. ඔහු විසින් කරන ලද වෙනත් නිර්මාණයක් නම් කරන්න.
(ලකුණු 3)

(02). 1.පණ්ඩුකාභය රජතුමා විසින් ඉදිකරන ලද වැව් තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)
2.මහවැව් තැනීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂා කල අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 4)
3.A) වැවක ප්‍රධාන කොටස් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
B) ඔබ ඉහත දැක්වූ කොටස් දෙකෙන් එකක් නිර්මාණය කර ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 3)

(03). 1.සෙල්ලිපිවල පහත සඳහන් නම් වලින් හඳුන්වා ඇත්තේ කුමන වෘත්තීන් වල යෙදුන පුද්ගලයින් ද?
A. කඹර
B. තඹර
C. තොපොෂ
(ලකුණු 3)

2.අපේ ආදිතමයන් මැටි කර්මාන්තය ට යොමු වීම ට බලපෑ ප්‍රධාන හේතු දෙකක් නම් කරන්න.
(ලකුණු 4)
3. A) යකඩ නිස්සාරණය කල පැරණි යකඩ උදුන් හමුවී ඇති ස්ථාන දෙකක් නම් කරන්න (ලකුණු 2)
B) මැටි භාණ්ඩ තැනීමේ මූලික පියවර තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(04).1.අනුරාධපුරයට අයත් බෝධිසත්ව ප්‍රතිමා දක්නට ලැබෙන ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3)
2.අතීතයේ දී පිළිමගෙවල් නිර්මාණයේ දී ලාංකිකයන් භාවිත කල සම්ප්‍රදායන් දෙකක් ලියන්න.
(ලකුණු 4)
3.A. ඇළ මාර්ග තැනීමේ දී මෙරට වැසියන් භාවිතා කල තාක්ෂණික ක්‍රමවේදයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)
B. ජල උද්‍යාන වල කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

(05). 1.මහනුවර රාජධානිය ට ආරක්ෂාව සැලසූ,
A. දුර්ග මාර්ග දෙකක්
B. කඳු වැටියක් නම් කරන්න. (ලකුණු 3)
2.පලමුවන විමලධර්මසූරිය රජතුමාගේ ආගමික සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 4)
3. A. උඩරට බලයට පත්වූ නායක්කාර් වංශික රජවරු දෙදෙනෙක් නම් කරන්න (ලකුණු 2)
B. දෙවන රාජසිංහ රජතුමාගෙන් ඉටු වූ දේශපාලන සේවාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(06). 1. මහනුවර රාජධානිය තුල පැවැති සම්ප්‍රදායික කර්මාන්ත තුනක් නම් කරන්න (ලකුණු 3)
2.මහනුවර රාජ්‍යය තුල පැවැති විවාහ ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 4)
3.A. මහනුවර රාජ්‍ය සමයට අයත්චිත්‍ර නිර්මාණ දැකිය හැකි ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)
B. එම චිත්‍ර වල දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

(07).1. පුනරුද සමයේ යුරෝපයේ වෛද්‍ය විද්‍යාවේ දියුණුව ට හේතු වූ නව සොයා ගැනීම් කල පුද්ගලයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)
2.යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)
3.A.පුනරුද සමයේ යුරෝපයේ බිහිවූ විශ්ව විද්‍යාල දෙකක් නම් කරන්න. (ලකුණු 2)
B. එකල කලා ශිල්ප වල දක්නට ලැබුණු වෙනස්කම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 3)

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව**

**දෙවන වාර පරීක්ෂණය - 2023**

**ඉතිහාසය**

**08 ශ්‍රේණිය**

**I පත්‍රය**

1. වසභ
2. මහාපරාක්‍රම
3. තිවංක පිළිමගේ
4. දෙවන රාජසිංහ රජතුමා
5. ජෝන් ෆයිබර්ස්
6. ×
7. √
8. √
9. ×
10. √
11. ශ්‍රී වික්‍රමරාජසිංහ
12. රාජාධිරාජසිංහ
13. චිත්‍ර කලාව
14. කීර්ති ශ්‍රී රාජසිංහ
15. ජොහැන්නස් ගුටෙන්බර්ග්
16. මයිකල් ආන්ජලෝ
17. ජොහැන්නස් කෙප්ලර්
18. රෙපරමාදු / ප්‍රොතෙස්තන්ත්‍ර
19. වොනෙටෙලෝ
20. ජෝතිය සිටු

(ලකුණු 2×20 = 40 )

**II පත්‍රය**

01. (අ).
1. යෝධ වැව - B
2. මහවැලි ගංගාව - A
3. කෝට්ටේ - F
4. මහනුවර - C
5. අනුරාධපුරය - D
6. සීගිරිය - E

(ලකුණු 1×6 = 06)

(ආ). 1. වාහල් කඩ
2. අනුරාධපුරය
3. අලංකාරය / ආරක්ෂාව (ලකුණු 1×3 = 03)

(ඇ). 1. මොනාලිසා
2.ලියනාඩෝඩාවින්ඩි
3. යුරෝපයේ පුනරුදය සමය (ලකුණු 1×3 = 03)

02. I.ජය වැව, ගාමිණී වැව , අභය වැව (ල.3)

II. කුඩා මධ්‍ය ප්‍රමාණයේ වැව් වලට ජලය සැපයීමට , දැඩි නියගයට මුහුණදීමට , කෘෂි කටයුතු වඩා හොඳින් කිරීමට , ගංවතුර පාලනය , වැඩිවන ජනගහනයට ආහාර නිපදවීමට වෙනත් නිවැරදි පිළිතුරු (ල 04)

III.A. වැව් බැම්ම, රළපනාව ,සොරොව්ව , බිසෝකොටුව, පිටවාන.................

B. - වැව් බැම්ම ⟶ ජලය රඳවා තබාගැනීමට
- රළපනාව ⟶ රළ පහරින් වැව් බැම්ම ආරක්ෂා කර ගැනීමට
- සොරොව්ව ⟶ වැවේ ජලය පිටතට ගැනීමට
- බිසෝකොටුව ⟶ පීඩනයෙන් වැව් බැම්මට වන හානිය වලක්වා ගැනීම (ල.6)

03. I.කබර ⟶ යකඩ කර්මාන්තය
තඹර ⟶ තඹ වැඩ / කර්මාන්තය
තොපෂ ⟶ ටින් ලෝහයෙන් (ල.3 )

II. - පහසුවෙන් සපයා ගත හැකි වීම
- පහසුවෙන් වැඩ කල හැකි අමුද්‍රව්‍යක් වීම (ල.4)

III. A.
- සුදුසු මැටි වර්ගයක් සපයා ගැනීම
- මැටි පදම් කිරීම
- සකපෝරුවෙ තබා හැඩය ලබා ගැනීම
- සුදුසු උෂ්ණත්වයක් යටතේ පුළුස්සා ගැනීම.............

B.
- බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන්
- සීගිරියේ අලකොලවැව ප්‍රදේශයෙන්
- මරං / යකඩ මරං (ල.6)

04. I.බුදුරුවගල, වැලිගම කුෂ්ඨරාජගල, යටාල වෙහෙර, දඹේගොඩ (ල.3)
II.ගන්ධ කුටි සම්ප්‍රදාය ,ගෙඩිගේ සම්ප්‍රදාය , ලෙන්විහාර සම්ප්‍රදාය (ල.4)

III. A.
- ඇළ මාර්ග ආරම්භය සහ අවසානය දක්වා නිවැරදි මිනුම් ලබා ගැනීම
- ඇළේ පහළ හා ගැඹුර නිසිලෙස පවත්වා ගැනීම
- ලිහිල් පස් ස්ථර ඇති තැන්වල ගල් බැමි බැඳීම
- ඇළ මාර්ගය පිටවාන් ගලින් තැනීම......................

B.
- භූමියේ ස්වභාවය හා පරිසරය සැලකිල්ලට ගැනීම
- සැලසුම් කළ මාර්ග පද්ධති - උයන් පාලකයන් පත් කිරීම
- කානු , පොකුණු , ජල මල් තැනීම
- එළිමහන් ගෙවල් , මණ්ඩප , ගස්වැල් වවා තිබීම (ල.6)

05. I. දුර්ග මාර්ග ———— බලන , හුන්නස්ගිරිය
කඩුවැටි ———— උඩවත්ත, හන්තාන (ල.3)

II.
- නව රාජවංශයක් ආරම්භ කිරීම
- කුසුමාසන දේවිය විවාහ කරගෙන රාජ්‍ය උරුමය ලබා ගැනීම
- පෘතුගීසි බලපෑමෙන් රට නිදහස් කර ගැනීම
- සීතාවක බලපෑමෙන් රට නිදහස් කර ගැනීම (ල.4)

III. A. ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධි රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ

B.
- බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම
- උඩරට හා පහතරට වෙහෙර විහාර පිළිසකර කිරීම
- මහනුවර දළදා මාලිගාව තැනවීම
- දළදා වහන්සේ දළදා මාළිගාවේ තැන්පත් කර දළදා පෙරහැර පැවැත්වීම (ල.6)

06. I.මැටි, ලෝහ, තඹ ,පිත්තල ,යකඩ උපකරණ ආදී තැනීම
පැදුරු ,ආවරණ, ලාක්ෂා................................ (ල.3)

II.

- දීග විවාහය
- බින්න විවාහය
- බහු පුරුෂ විවාහය / එකගෙයි කෑම (ල.4)

III. A.

- වෙස්සන්තර ජාතකය
- දහම් සොඬ ජාතකය
- කේල පත්ත ජාතකය
- බුදු සිරිත

B. - කෘෂිකර්මාන්තය
  - හේන් වගාව
  - වී ගොවිතැන
- කර්මාන්ත
- වෙළඳාම
- සත්ව පාලනය යන තේමා ඔස්සේ නිවැරදි කරුණු තුනක් 3 කට ලකුණු දෙන්න.

07.I.විලියම් හාවේ,වෙ පැරසල්සස් , මයිකල් සර්වෙස් (ල.3)

II.

- කොන්ස්තන්තිනෝපලය තුර්කින්ට යටත් වීම
- වෙළදාමේ දියුණුව හා ධනවතුන් බිහි වීම
- බුද්ධි අවබෝධය (ල.4)

III. A. බොලොඤ්ඤා , පාදුවා,පැරිස්,බක්ස්ෆර්ඩ් ,ක්‍රේම්බ්‍රිජ්

B.

- ලෞකිකත්වයට මුල්තැන දීම
- බිසෝවරු, කුමර කුමරියන්, ධනවත් පවුල්වල අයගේ චිත්‍ර / ප්‍රතිමා නිර්මාණය
- නිර්මාණය, ඒවායේ නිර්මාණකරුගේ නමින් බිහිවීම
- ධනවත් අයගේ අනුග්‍රහය ලැබීම
- ස්වාධීන නිර්මාණ බිහිවීම
- නිරුවත් හා අඩු නිරුවත් නිර්මාණ (ල.6)